රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:- 307

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1985 ඔක්තෝබර් මස 15 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත.

## දිළිඳු සහන කමිටු සාමාජිකයින්ට රාජකාරි නිවාඩු.

මෙතෙක් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව නිකුත් කළ ආහාර මුද්දර 1985 දෙසැම්බර් 01 වන දින සිට සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් නිකුත් කෙරේ.

02. 1985 අංක 32 දරණ දිළිඳු සහන පනත යටතේ පළ කරන ලද රෙගුලාසි අනුව, ආහාර මුද්දර අවශ්‍යතාව තක්සේරු කරන්නේ සෑම ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාශයකම පිහිටුවන දිළිඳු සහන කමිටුව නමින් හැඳින්වෙන කමිටුවක්ය.

03. ග්‍රාමසේවා නිලධාරියා, විශේෂ සේවා නිලධාරියා සහ වගා නිලධාරියා මෙම කමිටුවේ සාමාජිකයින් වන අතර, ප්‍රදේශයේ ග්‍රාමෝදය මණ්ඩලයේ සභාපතිවරයා හෝ මණ්ඩලයේ සාමාජිකයින් අතුරෙන් ඔහු නම් කරන නියෝජිතයෙකු ද, අදාල කොට්ඨාශයේ උප දිසාපති නම් කරන අයකුද කමිටුවේ සාමාජිකයින් වීමට විධිවිධාන සලසා ඇත. මෙසේ දිළිඳු සහන කමිටු පිහිටුවීමට නොහැකි ප්‍රදේශවල යථායෝග්‍ය පරිදි කමිටු පිහිටුවීමට රෙගුලාසි මගින් දිසාපතිවරුන්ට බලය පැවරී ඇත.

04. ග්‍රාමෝදය මණ්ඩලයක සභාපති හෝ එවැනි සභාපතිවරයකු හෝ දිසාපතිවරයකු හෝ උප දිසාපතිවරයකු හෝ විසින් දිළිඳු සහන කමිටුවක සාමාජිකයෙකු ලෙස පත්කර ඇති අයකු හෝ වන රජයේ නිලධරයකුට හෝ රාජ්‍ය සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවකයකුට හෝ එවැනි කමිටුවක රැස්වීම් සඳහා සහභාගිවීමට රාජකාරී නිවාඩු දිය යුතුය.

Siriwardhana
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.